# පටුන


**සංස්ථාපිත තොරතුරු** 01

**සභාපතිතුමාගේ පණිවිඩය** 02

**පාලන භාරකාරතුමාගේ පණිවිඩය** 03 - 04

**1. අරමුදලේ පසුබිම** 05 - 06

- 1.1 භාරකාර මණ්ඩලය 05
  - 2017 වසරේ අරමුදලේ කාර්යය මණ්ඩලය 06
- 1.2 සංවිධාන ව්‍යුහය

**2. 2017 වසරේ අරමුදලෙහි කාර්යසාධනය**

- 2.1 2017 වසරේ ප්‍රතිලාභීන් 07 - 09
- 2.2 ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය 10
- 2.3 නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම 11
- 2.4 ණය අයකරගැනීමේ ප්‍රගතිය
- 2.5 කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල 12
  - 2.5.1 කුලී ආදායම
  - 2.5.2 අරමුදලෙහි තිරසාරභාවය
  - 2.5.3 මෙහෙයුම් ආදායම 13

**3. සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය**

- 3.1 සේවක අභිප්‍රේරණය ඉහළ නැංවීම 14 - 16
- 3.2 අරමුදලේ බඳවා ගැනීමේ සහ උසස්වීම් පරිපාටින් 17
  - නව බඳවා ගැනීම්
- 3.3 අරමුදල් පරිශ්‍රය නවීකරණය කිරීම
- 3.4 කාර්යාලීය ක්‍රමවේදයන් විධිමත් කිරීම
- 3.5 කාර්ය මණ්ඩල ණය 18
- 3.6 ඉඩම් ඔප්පු සහ බැඳුම්කර
- 3.7 රැස්වීම්
- 3.8 විගණන හා කළමණාකරණ කමිටුව

**4. අනාගත සැලසුම්** 19

**5. ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව** 20

**6. ආදායම් ප්‍රකාශය** 21

**7. ශේෂපත්‍රය** 22

**8. මුදල් ප්‍රවාහ ප්‍රකාශය** 23 - 25

**9. ආදායම් ප්‍රකාශය** 26

**10. මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්** 27 - 33

**11. බඳුකරණය සඳහා ප්‍රතිපාදන** 33

# ලෝහෝර් ආර්යා ණය අරමුදල

## දැක්ම

රාජ්‍ය අංශයේ සේවකයින්ට මූල්‍ය පහසුකම්

සලසා දෙනු ලබන ප්‍රධානතම ආයතනය ලෙස ක්‍රියා කිරීම.

## මෙහෙවර

රාජ්‍ය අංශයේ සේවකයින් ණය බරින් මිදවීම හා ආපදාවකදී සහන සැලසීම මගින් තෘප්තිමත් මහජන සේවයකට දායක වෙමින් යහපත් රාජ්‍ය සේවයක් නගාසිටුවීමට දායකවීම.

## අභිමතාර්ථය

රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා හා පළාත් පාලන ආයතන වල සේවයේ නිරත සේවකයින්ට සහනශීලි පොලී ප්‍රතිශතයක්

යටතේ පහසු කොන්දේසි මත කෙටිකාලීන ණය මුදල් කඩිනමින් ලබා දීම

මගින් ඔවුන් ණය බරින් මුදවා ගැනීම.

## කාර්යභාරය

- ණය අරමුදල තිරසාරව පවත්වා ගනිමින් ප්‍රතිලාභීන් සඳහා ණය ලබා දීම.
- ආයතනික ප්‍රවර්ධනය සහ ධාරිතාවය වැඩි කිරීම.
- අරමුදල් සම්පාදනය කර ගනිමින් ආයතනය පවත්වා ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම හා ක්‍රියාත්මක කිරිම.
- ණය කළමණාකරනය සඳහා යෝග්‍යවන ක්‍රමෝපායන් දියුණු කිරීම සහ ණය දීමේ පහසුකම් වැඩි දියුණු කිරීම

## සංස්ථාපිත තොරතුරු

**ආයතනයේ නම ලිපිනය :**

- ලෝහෝර් ආර්යා ණය අරමුදල
- 100/ 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

**සංස්ථාපිත කිරීම :**

- 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල භාරකාර මණ්ඩල පනත (1953 සංශෝධිත) යටතේ ස්ථාපිත මුදල් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත ආයතනයකි.

**භාරකාර මණ්ඩලය :**

- ඒ. පී. කුරුම්බලපිටිය මහතා - සභාපති (අධ්‍යක්ෂ - රාජ්‍ය ගිණුම් දෙපාර්තුමේන්තුව), මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
- එස්.වින්ස්ටන් පතිරාජ මහතා - පාලන භාරකාර
- ඩබ්.ඩී.ජයසිංහ මයා - සාමාජික
- වසන්ත පෙරේරා මහතා - සාමාජික
- මර්ලින් දිසානායක මිය - සාමාජික

**විගණන කමිටුව :**

- පී.බී.එස්.සී. නෝනිස් මහතා - සභාපති, (අධ්‍යක්ෂ, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව), මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
- ඩබ්.ඩී.ජයසිංහ මයා - සාමාජික
- මර්ලින් දිසානායක මිය - සාමාජික

**විගණක** : රත්වත්ත සහ සමාගම,
වරලත් ගණකාධිකාරී,
141/3 වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

**නිල බැංකුකරු** : මහජන බැංකුව,
මූලස්ථාන ශාඛාව,
කොළඹ 02.

# සභාපතිතුමාගේ පණිවිඩය

1927 මාර්තු 26 දින ආරම්භ කරන ලද ලොහෝර් ආර්යා ණය අරමුදල 1951 අංක 38 දරණ ලොහෝර් ආර්යා ණය අරමුදල් පනත මගින් ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පරිවර්තනය කර ඇත.

ඒ අනුව, එහි ආරම්භයේ සිට රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිළධාරීන් හට සහනදායී පදනමක් යටතේ ඔවුන්ගේ කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා සපුරාගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සලසන ලදී.

වර්තමානයේදී, ආරම්භයේ ණය පහසුකම් ලබාදුන් ක්ෂේත්‍රයන්ට අමතරව කාලීන අවශ්‍යතාවයන් සැළකිල්ලට ගෙන විවිධ අරමුණු වෙනුවෙන් ණය අරමුදල් සැපයීම සඳහා අරමුදල වෙත ඉල්ලීම් ලැබේ. ඒ අනුව අරමුදල සතු ප්‍රතිපාදන සීමාව තුළ එකී අවශ්‍යතාවයන්ද හැකිතාක් දුරට සපුරාලීම සඳහා අවශ්‍ය පියවර ගෙන රට තුළ ක්‍රියාත්මක වාණිජ බැංකු ක්‍රමයට විකල්පයක් ලෙස ක්‍රියාත්මක වීමට ඇති අවස්ථාව මෙම අරමුදලට ලැබී ඇත. ඒ අනුව, එම පවත්නා අවස්ථාව තවදුරටත් වැඩිදියුණු කරගැනීම සඳහා පවත්නා ව්‍යවස්ථාවට අවශ්‍ය සංශෝධන සිදුකර වර්තමාන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි නවීන තාක්ෂණය ද උපයෝගී කරගෙන අරමුදලේ ක්‍රියාකාරීත්වය සැලසුම් කිරීම වර්තමාන පාලන අධිකාරියේ මුඛ්‍ය කාර්යයක් වී ඇත.

විශේෂයෙන් ණය බරින් නිදහස් වීමට අමතරව සේවකයන් විශ්‍රාම යාමෙන් පසු ඔවුන්ගේ ආර්ථිකය නගා සිටුවීම සඳහා එම සේවකයන් හට කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වෙනුවෙන් ණය පහසුකම් ලබා දීමට ඇති හැකියාව පාලන මණ්ඩලයේ විශේෂ අවධානය යොමු වී ඇත.

එමෙන්ම දීර්ඝකාලීනව පැවති හිඟ ණය අයකර ගැනීම සඳහා 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ විශේෂ පසුවිපරම් ක්‍රියාවලිය හේතුවෙන් 2017 වර්ෂය අවසන් වන විට එම දීර්ඝ කාලීනව හිඟව පැවති බොහොමයක් ණය ශේෂ අයකර ගැනීමට හැකි වූ අතර ඉදිරියේදී හිඟ ණය ශේෂ අවම මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

අරමුදලේ මෙහෙයුම් ක්‍රියාවලිය දීර්ඝකාලීනව සංශෝධනයන්ට ලක් කර නොමැති අතර විශේෂයෙන් කාලීනව සිදුකරන ලද වෙනස්කම් වලට ගැළපෙන පරිදි මෙහෙයුම් පද්ධතිය ද වෙනස් කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත.

ඒ අනුව, දැනටමත් ණය අරමුදල් ලබා දීමේ ක්‍රියාවලිය අධ්‍යයනය කර අනවශ්‍ය ක්‍රියාපිළිවෙත් ඉවත් කර වඩාත් සරල ක්‍රියාමාර්ග හඳුන්වාදීම සඳහා පාලන භාරකාර සාමාජිකයෙකුගේ සභාපතීත්වයෙන් සමන්විත කමිටුවක් පත්කර එම කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

මීට අමතරව ණය ලබා දීම, පොලී හා වාරික අයකර ගැනීම ඇතුළුව දැනට පරිගණක ගත කර ඇති ක්‍රම පද්ධතීන් නැවත අධ්‍යයනය කර එම පද්ධතියට සිදුකළ යුතු සංශෝධන තිබේනම් ඒ පිළිබඳ නිර්දේශ ලබාදීම සඳහා අරමුදලේ බාහිර විගණකවරුන් වෙත පවරා ඇත.

ඒ අනුව, අරමුදලේ කාර්යයන් විධිමත් පරිදි විනිවිදභාවයකින් යුතුව වැරදි හා වංචා අවම වන පරිදි ක්‍රියාත්මක වන බවට පාලන භාරකාර මණ්ඩලයට අවශ්‍ය තහවුරු කිරීමක් ලැබෙනු ඇත.

අවසාන වශයෙන් 2017 වර්ෂය තුල අරමුදල තම වාර්ෂික කාර්යසාධන සැලැස්ම තුල ඇතුළත් කළ අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට සමත් වූ අතර ඒ සඳහා පාලන භාරකාර සාමාජිකයන් සාමූහිකව හා තනි තනිව දැක්වූ දායකත්වය හා මග පෙන්වීම මූලික වශයෙන් හේතු විය. අරමුදලේ කාර්යය මණ්ඩලය විසින් ද තම තමන් වෙත පැවරූ නිශ්චිත රාජකාරී මෙන්ම පොදුවේ ආයතනයේ කාර්යයන් සඳහා දැක්වූ ඉහළ දායකත්වය මෙම සාර්ථකත්වය සඳහා ප්‍රධාන වශයෙන් ඉවහල් වන ලදී.

ඒ අනුව, 2017 වර්ෂය තුළ ලඟා කරගත් කාර්ය සාධනය පිළිබඳ සතුටු වන අතරම තවදුරටත් 2018 වර්ෂය තුළ සම්පූර්ණ කර ගත යුතු අරමුණු සාර්ථක කර ගැනීම සඳහා පාලන භාරකාර සාමාජිකයන් ඇතුළු සමස්ථ කාර්යය මණ්ඩලයේ සහයෝගය ඇතිව කැපවන බවට සහතික වෙමි.



ඒ.පී. කුරුම්බලපිටිය
සභාපති
ලෝහෝර් ආර්යා ණය අරමුදල

# පාලන භාරකාරතුමාගේ පණිවිඩය



ලංකාවේ කලක් වාසය කළ ස්කොට්ලන්තයේ මිලියනපතියෙකුගේ බිරිය වන ජීන් ලෝහෝර් ආර්යාව විසින් එවකට පුණ්‍ය කොමසාරිස්ව සිටි සී.ඊ.වී.නැතනියල්ස් පියතුමාගේ සහයෝගයත් සමඟ 1927 පෙබරවාරි මස 17 වන දින ලෝහෝර් ආර්යා ණය අරමුදල ආරම්භ කරන ලද අතර, මෙම අරමුදල මුදල් අමාත්‍යාංශය යටතේ 1958 අංක 38 දරණ ලෝහෝර් ආර්යා පනත මඟින් ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත් කරන ලදි. එකල සිට මෙම අරමුදල මුදල් අමාත්‍යාංශය විසින් පත්කරන ලද භාරකාර මණ්ඩලයක අධීක්ෂණය යටතේ පාලන භාරකාර විසින් කළමනාකරණය කෙරේ.

2015 ජනවාරි මස 08 වන දින පත් වූ ජනපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් යහපාලන රජය පිහිටුවීමත් සමඟ 2015 පෙබරවාරි 27 වන දින පාලන භාරකාර ලෙස මම මෙම අරමුදල භාර ගත්තෙමි. එලෙස පාලන භාරකාර ධූරයට පත් වූ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ රාජ්‍ය සේවකයෙකු වශයෙන් මාගේ පළමු පියවර වූයේ අරමුදල හා එහි ක්‍රියාකාරීත්වය හොඳින් අධ්‍යයනය කිරීම හා වර්තමානයට අනුකූලව භාරකාර මණ්ඩලයේ අනුමැතියට අනුව අරමුදල ප්‍රතිව්‍යුහ ගත කිරීමයි. මාගේ දෙවසරක ධූර කාලය තුළ රාජ්‍ය සේවකයින් හට ණය ලබා දීමේ ක්‍රියාවලිය සරල කිරීම හා අප අරමුදලේ ණය ලබා දීමේ දී මුහුණ දීමට සිදුවන තරඟකාරී වෙළඳපොල, අභියෝග සහ අනෙකුත් ණය දෙන ආයතනයන්ගේ තරඟකාරීත්වයට එඩිතරව මුහුණ දීමට හැකි වන ලෙසට අප ආයතනයේ පරිපාලනය, ගිණුම්කරණය සහ තොරතුරු තාක්ෂණය යන අංශයන් ශීඝ්‍රයෙන් වර්ධනය වන සමාජයීය ආර්ථික අවශ්‍යතාවයන් සහ දියුණු තාත්ෂණයට ඔබින සේ විධිමත් කරන ලදි.

මාගේ මෙම සේවා කාලය තුළ අවුරුදු 30ක කාලයක් පුරාවට මාණ්ඩලික නොවන රාජ්‍ය සේවකයන් හට ලබා දෙන ලද උපරිම ණය ප්‍රමාණය වන රු.50,000/- ක ණය ප්‍රමාණය රු.100,000/- දක්වා ද, මාණ්ඩලික ශ්‍රේණියේ රාජ්‍ය සේවකයන් හට ලබා දුන් ණය මුදල රු.250,000/- දක්වා ද ඉහල නැංවීමට හැකි විය.

එමෙන්ම රාජ්‍ය සේවකයන්ගේ මූල්‍ය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සතියක් ඇතුලත සිය ණය මුදල ලබා ගැනීමට පහසුකම් සලසා දී ඇත. එමෙන්ම අප අරමුදල වෙත පැමිණීමෙන් පමණක් ලබා ගත් ණය වර්තමානයේ දී අප ආයතනයේ නිල වෙබ් අඩවියට අරමුදලේ තොරතුරු ත්‍රෛ භාෂාවෙන් ඇතුලත් කිරීමෙන් අනතුරුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සිටින රාජ්‍ය සේවකයෙකුට ඉතාමත් පහසුවෙන් අයදුම්පත්‍රය බාගත කර ගත හැකි අතර ඉතාමත් කෙටි කාලයක් තුළ ණය මුදල් ලබාගැනීමට ද හැකිය. එමෙන්ම පූර්වයේදී ණය ඉල්ලුම්පත්‍රයක් භාර දීමෙන් පසු ණය ලබා ගැනීමට මාස 2 - 3ක කාලයක් ගත වී ඇති අතර වර්තමානයේ දී සතියක් ඇතුලත ණය ලබා ගැනීමට හැකිය. මේ වන විට ණය අයැදුම්පත් භාර දුන් දිනයේ සිට ණය ලබා ගැනීමට අරමුදල වෙත පැමිණිය යුතු වාර ගණන ද 5 සිට 2ක් දක්වා අඩුකර ඇත.

සමස්තයක් වශයෙන් ගත් කල, අරමුදලේ ආර්ථික කාර්යක්ෂමතාව සහ ශ්‍රම බලකායේ ඵලදායී මට්ටම, කාර්ය මණ්ඩළයේ පුහුණු අවශ්‍යතාවයන්ට අනුව පුහුණුවීම් ලබා දීම මගින් විශිෂ්ඨ වර්ධනයක් සහ සේවා ස්ථානයේ සුභ සාධනය වැඩි දියුණු කිරීම මගින් අරමදලේ ශ්‍රමබලකායට තම සේවා ස්ථානය තුලදී ස්ව ආත්ම තෘප්තිය සහ ආත්ම පරිපූර්ණත්වය උදාකර ගැනීමට හැකි වී ඇත.

අවුරුදු 50ක කාලයක් පුරාවට අළුත්වැඩියාවකට ලක් නොවූ ලෝ.ආ.ණ.අරමුදලේ ගොඩනැගිල්ල වත්මන් කාලයට ගැලපෙන ආකාරයට හා අපගේ සේවාදායකයින් තම සේවාව සතුටුදායක ලෙසත්, සෞඛ්‍ය සම්පන්න ලෙසත් ලබා ගැනීමට අවශ්‍ය වන පරිදි අළුත්වැඩියා කරන ලදි.

2017 වසරේ දී මාසිකව නිකුත් කළ 386ක ණය ප්‍රමාණය, 2015 වසරේ දී නිකුත් කළ 372ක ණය ප්‍රමාණයට සාපේක්ෂව සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර 2015 වසරේ දී ලබා දුන් රු.මිලියන 24ක ණය මුදල් ප්‍රමාණය 2017 වසරේ දී රු.මිලියන 33 දක්වා වැඩි වී ඇත. අප ආයතන ගොඩනැගිල්ලේ 1 වන සහ 2 වන මහල් කුලියට දීමෙන් මසකට උපයන කුලි ආදායම මිලියන 2 ක් වේ. එමෙන්ම 2015 දී අප අරමුදල ඉපැයූ රු.මිලියන 17.1ක වාර්ෂික ආදායමට සාපේක්ෂව 2017 වර්ෂයේ දී රු.මිලියන 30 දක්වා වර්ධනය වී ඇත.

අප අරමුදල වෙත පැමිණෙන සේවාදායකයින්ගේ අදහස් උදහස් යෝජනා සහ පැමිණිලි ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සලසා දීමේ අරමුණින් ආයතනයේ යෝජනා/ පැමිණිලි පෙට්ටියක් තබා ඇත. එපමණක් නොව එම පැමිණිලි පාලන භාරකාරගේ අධීක්ෂණය යටතේ දිනපතා පරීක්ෂා කෙරෙන අතර ඉදිරිපත් වන යෝජනාවන් පිළිබඳව අදාල නිලධාරින් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව එම යෝජනාවන් සඳහා නිසි විසඳුම් ද ගනු ලැබේ.

අප අරමුදල් සේවයේ 90  වැනි සංවත්සරය නිමිත්තෙන් 2017 පෙබරවාරි මස 27 වන දින එවකට මුදල් ඇමතිතුමා සහ ජීන් ලෝහෝර් ආර්යාවගේ මුණුපුරා සහ ඔහුගේ බිරිය යන අයගේ සහභාගිත්වයෙන් ඉතාමත් අලංකාර උත්සවයක් අප ආයතනයේ දී පවත්වන ලදි. එම උත්සවයේ දී ජීන් ලෝහෝර් ආර්යාවගේ මුණුපුරා වන ජෝන් හැමිෂ් මහතා සභාව අමතමින් ඉතාමත් වැදගත්, සැලකිය යුතු කරුණක් ඉදිරිපත් කළේය. එනම් තම මිත්තනිය වන ජීන් මිය අදත් ජීවතුන් අතර සිටියානම්, ඇය මෙලොවෙහි ජීවත් වූ ඉතාමත් ප්‍රීතිමත් පුද්ගලයා වන බවත් එයට හේතුව නම් 1927 වර්ෂයේ දී ඇය විසින් ලබා දෙන ලද සුළු පරිත්‍යාගයකින් ආරම්භ කරන ලද මෙම අරමුදල මෙතෙක් දුරට දියුණු වී ඇති අතර මෙම රටේ පීඩා විඳින බොහෝ රාජ්‍ය සේවකයන්ට මෙමගින් සහනයක් ලබා දෙන නිසාවෙන් යැයි ඔහු පැවසීය.

මෙම අරමුදලෙන් ලබා දෙන සේවාව අප රටේ දුර බැහැර ප්‍රදේශ වල සිටින  රාජ්‍ය සේවකයන්ට ද කාලය අපතේ යැවීමකින් තොරව හා පීඩාවකින් තොරව ලබා ගැනීමට හැකිවනු පිණිස දිවයිනේ තෝරාගත් දිස්ත්‍රික්ක 10 ක අරමුදලේ ශාඛාවන් ආරම්භ කිරීමට මා විසින් ඉදිරිපත් කරන ලද යෝජිත ව්‍යාපෘතිය රාජ්‍ය භාණ්ඩාගාරය විසින් පිළිගන්නා ලද නමුත් මතු වූ මූල්‍ය අපහසුතාවයන් මත එය ඉෂ්ඨසිද්ධ  කරගැනීමට නොහැකිවිය. කෙසේ හෝ මෙම වැඩපිළිවෙල කෙදිනක හෝ ක්‍රියාත්මක කර සියළුම ප්‍රදේශ වල සිටින රාජ්‍ය සේවකයන්ට ඉතාමත් කෙටි කාලයක් තුළ ණය ලබා ගැනීමේ පහසුකම් සලසා දීමට කටයුතු කිරිමට අපි අරමුණු කර සිටිනුයේ අද වන විට අප ආයතනයෙන් ණය ලබා ගැනීමට පැමිණෙන සේවාදායකයින්ගේ ගණන වැඩි වී ඇති බැවින්  සහ රාජ්‍ය සේවකයින් අතර අපගේ අරමුදල ඉතාමත් ප්‍රසිද්ධ වි ඇති බැවිනි.

තවද මාගේ මෙම සේවා කාලයේ දී සාර්ථකත්වය කරා ලඟා වීමට මට අතහිත දුන් ගරු මුදල් අමාත්‍යතුමාට ද, රාජ්‍ය අමාත්‍යතුමාට ද, මුදල් අමාත්‍යාංශයේ ලේකම් යන අයට ද මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරන අතර, අප අරමුදලේ භාරකාර මණ්ඩලයට ද, කාර්ය මණ්ඩලයට ද මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. එමෙන්ම මාගේ නිර්මාණාත්මක, නව්‍යකරණයේ තරඟකාරී අදහස් උපයෝගි කරගෙන අප අරමුදල තවදුරටත් දියුණුව කරා රැගෙන යාමට ශක්තියක් ලබා දීමටත්, එමගින් අප අරමුදල වෙත දහසක් බලාපොරොත්තු සමගින් පැමිණෙන රාජ්‍ය සේවකයින්ට අරමුදලේ දැක්ම, මෙහෙවර සාක්ෂාත් වන පරිදි උපරිම සේවයක් ලබා දීමට ඇප කැප වන බවට සහතික වෙමි.



එස්.වින්ස්ටන් පතිරාජ
පාලන භාරකාර
ලෝහෝර් ආර්යා ණය අරමුදල

# 01

# අරමුදලේ පසුබිම



ජීන් ලෝහෝර් ආර්යාව

ලංකාවේ කලක් වාසය කල ස්කොට්ලන්ත ජාතික ජීන් ලෝහෝර් ආර්යාව විසින් ණය අරමුදලක් පිහිටුවීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය සඳහා පවුම් 300 ක මුදලක් පරිත්‍යාග කර තිබිණි. එවකට පුණ්‍ය කොමසාරිස්ව සිටි සී.ඊ.වී.නැතනියල් දේවගැතිතුමා අරමුදල පිහිටුවීමේ කාර්යයෙහි මූලිකව කටයුතු කර ඇති අතර එය 1927 මාර්තු 26 වන දින ලෝහෝර් ආර්යා ණය අරමුදල නමින් ආරම්භ කරන ලදී. එමෙන්ම අරමුදල 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනත මගින් ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත් විය.

එදා සිට මෙම අරමුදල ප්‍රතිලාභීන් වෙත ණය ප්‍රදානය කරමින් සහ එම ණය ආපසු අයකර ගනිමින් චක්‍රිය අරමුදලක් ලෙසින් ක්‍රියාත්මක වෙමින් පවතී. රාජ්‍ය අංශයේ මෙන්ම වෙළඳ සමාගම්වල සේවය කරන සේවකයින්ටද තමන්ගේ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරා ගැනීමට එවකට පැවති බැංකු ක්‍රමයෙන් පිටිවහලක් නොලැබුන හෙයින් ඔවුන් අධික පොළියට ණය සපයන පුද්ගලයන්ගෙන් ණය ලබා ගැනීමට පුරුදුවී සිටියහ. මේ පසුබිම තුල රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයින්ද ණය බරින් පීඩනයට පත්විය. මෙවැනි පරිසරයක් තුල ලෝහෝර් ආර්යා ණය අරමුදල පිහිටුවීමෙන් පසු මෙම සේවකයින්ට ණය ලබා ගැනිමේදි ඉමහත් සහනයක් සැලසුනි. 1951 මෙම පනත ව්‍යවස්ථාගත වීමත් සමගම අරමුදලට රජයෙන් මෙන්ම වෙනත් පරිත්‍යාගශීලීන්ගෙන් ද ලැබුන ආධාර උපයෝගි කරගෙන මෙම ආයතනයටම අයත් තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ඇත.

## 1.1 භාරකාර මණ්ඩලය



භාරකාර මණ්ඩලය ගරු මුදල් ඇමතිතුමා විසින් පත් කරනු ලබන රාජ්‍ය අංශයේ සහ සුදුසුකම් ලත් පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ. මෙම ආයතනයෙහි අනුශාසකධුරය මුදල් අමාත්‍යතුමා විසින් හොබවනු ලබයි. අරමුදලෙහි පරිපාලන කටයුතු සඳහා පාලන භාරකරුවකු ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනතේ 10 වන හා 11 වන වගන්ති ප්‍රකාරව භාරකාර මණ්ඩලය සඳහා පත් වු අය අතරින් කෙනෙකු පත්කරනු ලැබේ. එම පනතෙහි 5 වන වගන්තියට අනුව භාරකාර මණ්ඩලයෙහි සභාපති තනතුර භාණ්ඩාගාර නියෝජිතවරයා වෙත පවරා ඇත

වගුව 01- 2017 වසරේ අරමුදලේ කාර්යය මණ්ඩලය

| අනුමත තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව |
|---|---|---|
| ගණකාධිකාරී | 01 | 01 |
| පරිපාලන නිලධාරී | 01 | 01 |
| ගිණුම් නිලධාරී | 01 | 01 |
| අභ්‍යන්තර විගණන නිලධාරී | 01 | 01 |
| ණය අයකර ගැනීමේ නිලධාරී | 01 | 01 |
| තොරතුරු තාක්ෂණ නිලධාරී | 01 | 01 |
| කළමනාකරණ සහකාර ( තාක්ෂණික නොවන ශ්‍රේණිය) (ලේඛනාගාර සහකාර ඇතුළු) | 34 } 35 | 32 |
| ගොඩනැගිලි අධීක්ෂක (කළමනාකරණ සහකාර - තාක්ෂණික ශ්‍රේණිය) | 01 | - |
| කාර්යාල කාර්ය සහායක ( ප්‍රාථමික ශිල්පීය නොවන ) (නිල බංගලා භාරකරු ඇතුළුව) | 07 | 07 |
| ගොඩනැගිලි නඩත්තු සහායක ( ප්‍රාථමික අර්ධ ශිල්පීය ) | 01 | 01 |
| රියදුරු ( ප්‍රාථමික ශිල්පීය ) | 02 | 02 |
| **එකතුව** | **51** | **48** |

## 1.2 සංවිධාන ව්‍යුහය



# 02

## 2017 වසරේ අරමුදලෙහි කාර්යසාධනය

### 2.1 2017 වසරේ ප්‍රතිලාභීන්

2017 වසරේදී රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු සේවකයින් 4062 ක් මෙම අරමුදලේ ප්‍රතිලාභීන් වී ඇත. එම ප්‍රතිලාභීන් පදිංචි දිස්ත්‍රික්කය අනුව දෙවන වගුවෙහි වර්ගීකරණය කර ඇති අතර 2017 වර්ෂයේදී පෙර වසරට සාපේක්ෂව ණය ප්‍රමාණයේ 10.47% ක වැඩි වීමක් දක්නට ලැබුණු අතර, ණය මුදල් ප්‍රමාණයේ පෙර වසරට සාපේක්ෂව 19.9% ක ප්‍රගතියක් ද දක්නට ඇත. ප්‍රතිලාභීන්ගෙන් 75% අධික පිරිසක් ආරක්ෂක අංශයේ නියුතු පුද්ගලයින් වන බව 03 වන වගුවෙන් නිරූපනය වේ

**වගුව 02 – 2016 / 2017 වර්ෂවල ණය ලබා ගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව**

| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | 2017 | (%) | 2016 | (%) |
| කොළඹ | 612 | 15.07 | 531 | 14.44 |
| ගම්පහ | 711 | 17.50 | 561 | 15.26 |
| අනුරාධපුරය | 234 | 5.76 | 257 | 6.99 |
| මහනුවර | 230 | 5.66 | 205 | 5.58 |
| වව්නියාව | 04 | 0.098 | 04 | 0.11 |
| කළුතර | 423 | 10.41 | 338 | 9.19 |
| රත්නපුර | 164 | 4.04 | 154 | 4.19 |
| ගාල්ල | 234 | 5.76 | 205 | 5.58 |
| කුරුණෑගල | 372 | 9.16 | 368 | 10.01 |
| පුත්තලම | 42 | 1.03 | 52 | 1.41 |
| යාපනය | 00 | 0.00 | 01 | 0.03 |
| පොළොන්නරුව | 85 | 2.09 | 107 | 2.91 |
| ත්‍රිකුණාමලය | 19 | 0.47 | 15 | 0.41 |
| මුලතිව් | 01 | 0.02 | 03 | 0.08 |
| බදුල්ල | 161 | 3.96 | 146 | 3.97 |
| මාතලේ | 92 | 2.22 | 77 | 2.09 |
| හම්බන්තොට | 100 | 2.46 | 111 | 3.02 |
| කෑගල්ල | 222 | 5.47 | 212 | 5.77 |
| මඩකලපුව | 03 | 0.07 | 04 | 0.11 |
| අම්පාර | 68 | 1.67 | 68 | 1.85 |
| මොණරාගල | 105 | 2.58 | 93 | 2.53 |
| නුවරඑළිය | 56 | 1.38 | 58 | 1.58 |
| මාතර | 124 | 3.05 | 107 | 2.91 |
| එකතුව | **4062** | **100** | **3677** | **100** |




**ප්‍රස්තාරය 01 - 2016 / 2017 වර්ෂවල ණය ලබා ගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව**

## වගුව 03 - 2016 හා 2017 වර්ෂවල රාජ්‍ය සේවා ප්‍රතිලාභීන් තනතුරු අනුව

| | රාජ්‍ය සේවා ප්‍රතිලාභීන් | |
|---|---|---|
| **තනතුර** | **2017** | **2016** |
| කෝප්‍රල් | 687 | 1117 |
| හමුදා සෙබල | 426 | 699 |
| හමුදා සැරයන් | 84 | 121 |
| මේජර් | 22 | 16 |
| ලුතිනන් | 9 | 8 |
| අරක්කැමි | 21 | 28 |
| භෝජනාගාර සේවක | 30 | 32 |
| පොලිස් කොස්තාපල් | 1185 | 496 |
| පොලිස් සැරයන් | 277 | 120 |
| පොලිස් පරීක්ෂක | 46 | 31 |
| උප පොලිස් පරීක්ෂක | 60 | 28 |
| පොලිස් ආරක්ෂක සහායක | 26 | 23 |
| පොලිස් සිවිල් සහායක | 0 | 0 |
| ගිනිභටයන් | 20 | 15 |
| රියදුරු | 134 | 105 |
| බන්ධනාගාර නියාමක | 55 | 26 |
| මැනුම් සහායක | 36 | 26 |
| සෞඛ්‍ය පරිපාලක | 0 | 0 |
| උපස්ථායක | 4 | 3 |
| සාමාන්‍ය කම්කරු | 288 | 232 |
| කාර්යාල කාර්යය සහායක | 247 | 226 |
| කළමනාකරණ සහකාර | 162 | 116 |
| සංවර්ධන සහකාර | 22 | 9 |
| මුරකරු | 4 | 11 |
| මෝටර් කාර්මික | 6 | 4 |
| කාර්මික ශිල්පි | 0 | 0 |
| වඩු කාර්මික නිලධාරී | 2 | 4 |
| මානව සම්පත් සහකාර | 0 | 0 |
| පරිපාලන නිලධාරී | 2 | 1 |
| පෙදරේරු | 3 | 3 |
| ගණකාධිකාරී | 12 | 5 |
| ගබඩා සහායක | 3 | 1 |
| විදුලි කාර්මික | 2 | 1 |
| ඕවර්සියර් | 2 | 1 |
| තැපැල් නිලධාරී | 3 | 4 |
| සහකාර අධ්‍යක්ෂක | 1 | 2 |
| පිළිගැනීමේ නිලධාරී | 0 | 1 |
| පොත් බැඳුම්කරු | 1 | 3 |
| ග්‍රාම නිලධාරී | 0 | 0 |
| වැඩසටහන් සහකාර | 6 | 3 |
| කොමිෂන් නොලත් නිලධාරි | 4 | 4 |
| බලලත් නිලධාරි | 10 | 9 |
| මැනුම් ක්ෂේත්‍ර සහායක | 0 | 6 |
| හෙද නිලධාරී | 2 | 9 |
| කපිතාන් | 34 | 23 |
| අස්ගොව් | 1 | 5 |
| විදුලි පහන් දල්වන්නා | 0 | 1 |
| යන්ත්‍ර ක්‍රියාකරු | 3 | 1 |
| තාක්ෂණ නිලධාරී | 2 | 1 |
| තැපැල්කරු | 7 | 3 |
| පරිවර්තක | 0 | 1 |
| කර්නල් | 0 | 5 |
| පෙර පාසල් ගුරු | 0 | 2 |
| පුස්තකාලාධිපති | 1 | 1 |
| පුස්තකාල සහායක | 1 | 0 |
| අධ්‍යක්ෂක | 1 | 4 |
| කැමරා ශිල්පි | 108 | 0 |
| වෙනත් | 0 | 81 |
| එකතුව | 4062 | 3677 |

## 2.2 2017 වසරේ ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය

පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයෙකුට මෙම අරමුදලෙන් ණය අයදුම් කළ හැක.

- විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු වසර 3 ක අවම ස්ථිර සේවා කාලයක් හිමි රාජ්‍ය සේවකයකු වීම.
- අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් වසර 5 ක අවම ස්ථිර සේවා කාලයක් සපුරා තිබීම.
- ලබා දෙනු ලබන ණය මුදල් සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට තරම් ප්‍රමාණවත් සේවා කාලයක් තිබීම.( විශ්‍රාම ගන්නා වයස් සීමාව අවුරුදු 55 ලෙස සලකයි)
- අයදුම්කරු සඳහා ඉහත සුදුසුකම් සහිත ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කිරීම.
- අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් ඇපකරුවන් දෙදෙනාගෙන් එක් අයකු අවම වශයෙන් වසර 03 ක ස්ථිර සේවා කාලයක් පවතින විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු අයකු වීම.
- සියළුම ණය අයදුම්කරුවන්ගේ මාසික වේතනයෙන් 40% සීමාව තුල ණය වාරිකය අයකර ගැනීමේ හැකියාව තිබීම.

ඉහත සුදුසුකම්ලාභීන්ගෙන් ඉදිරිපත් වූ අයදුම්පත්‍ර හා ණය නිකුත් කිරීම පිළිබඳව 2017 වසරේ ප්‍රගතිය පහත වගුවෙන් පැහැදිලි වේ

### වගුව - 04 - ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය - 2017

| මාසය | ණය අයදුම් කළ සංඛ්‍යාව | නිකුත් කල ණය සංඛ්‍යාව | ණය වටිනාකම (රු. 000) |
|---|---|---|---|
| ජනවාරි | 273 | 273 | 24,500 |
| පෙබරවාරි | 276 | 251 | 22,600 |
| මාර්තු | 426 | 401 | 36,720 |
| අප්‍රේල් | 193 | 253 | 23,100 |
| මැයි | 324 | 267 | 24,770 |
| ජූනි | 357 | 351 | 31,870 |
| ජූලි | 316 | 319 | 28,890 |
| අගෝස්තු | 474 | 439 | 40,240 |
| සැප්තැම්බර් | 445 | 374 | 33,340 |
| ඔක්තෝබර් | 400 | 405 | 35,990 |
| නොවැම්බර් | 375 | 367 | 32,260 |
| දෙසැම්බර් | 344 | 362 | 31,440 |
| **එකතුව** | **4203** | **4062** | **365,720** |




2017 වසරේ දී ණය අයදුම් කළ සංඛ්‍යාව 4203 වුවද නිකුත් කල ණය සංඛ්‍යාව 4062 විය. මෙම වෙනසට ආසන්නතම හේතුව වන්නේ ණය අයදුම් කල සියළු දෙනාම ණය ලබා ගැනීම සඳහා ඉදිරිපත් නොවීම ලෙස දැක්විය හැක.

**ප්‍රස්තාරය - 02 ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය - 2017**

## 2.3 නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම

2017 වසරේ දි ණය ප්‍රමාණයේ පෙර වසරට සාපේකෂව 10.47% ක වැඩි වීමක් දක්නට ලැබෙන අතර ණය මුදල් ප්‍රමාණයද පෙර වසරට සාපේක්ෂව 19.9% ක ප්‍රගතියක් අත් කරගෙන ඇත. 2016 වසරේ සිට වැඩි පොළී ආදායමක් අප අරමුදල වෙත ලබා ගැනීමේ අරමුණින් ණය මුදලින් වැඩි කොටසක් රු.250,000.00 සහ රු.100,000.00 ණය බාණ්ඩ වෙත යොමු කිරීම සහ ආයතනික ණය ක්‍රමවේදය පිළිබඳ ලිපි මඟින් ආයතනික වශයෙන් සිදුකරන ලද දැනුවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2016 ට සාපේක්ෂව 2017 වසරේ දි නිකුත් කරන ලද රු.250,000.00 ණය ප්‍රමාණය 116% කින් සහ රු.100,000.00 ණය ප්‍රමාණය 27% වැනි ඉතා සාධනීය වර්ධනයක් අත්පත් කරගැනීම තුලින් 2016 වසරට සාපේක්ෂව 2017 දී ණය ප්‍රමාණයේ සහ ණය මුදල් ප්‍රමාණයද වර්ධනය වි ඇත.

### වගුව 05 - ණය මුදල් සීමාවන් අනුව ප්‍රගතිය

| උපරිම ණය සීමාව | නිකුත් කල ණය සංඛ්‍යාව | ණය මුදල් වටිනාකම |
|---|---|---|
| 250,000 | 78 | 19,500,000 |
| 100,000 | 2985 | 298,500,000 |
| 50,000 | 866 | 43,300,0000 |
| 40,000 | 65 | 2,600,000 |
| 30,000 | 46 | 1,380,000 |
| 20,000 | 22 | 440,000 |
| 10,000 | 0 | 0 |
| **එකතුව** | **4062** | **365,720,000** |

## 2.4 ණය අයකර ගැනීමේ ප්‍රගතිය

2014 සිට 2017 වසර වලට අදාලව ණය මුදල් නිකුත් කිරීම හා අයකර ගැනීමේ ප්‍රගතිය 06 වන වගුවෙන් හා 03 වන ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ. 2016 වර්ෂයට සාපේක්ෂව 2017 දී ආකර්ශනීය ප්‍රගතියක් පෙන්වා ඇත.

- ණය මුදල් නිකුත් කිරීම - ප්‍රගතිය - 19.9%
- ණය අයකර ගැනීමේ - ප්‍රගතිය - 13.8%

### වගුව 06 – 2014 සිට 2017 වසර දක්වා ණය නිකුත් කිරීම සහ ණය අයකර ගැනීම

| වර්ෂය | ණය සංඛ්‍යාව | ණය නිකුත් කිරීම (රු. 000) | ණය අයකර ගැනීම (රු. 000) |
|---|---|---|---|
| **2014** | 5122 | 203,505 | 252,973 |
| **2015** | 4636 | 284,860 | 273,868 |
| **2016** | 3676 | 305.000 | 342.358 |
| **2017** | **4062** | **365,720** | 389,506 |




ප්‍රස්තාරය - 03 ණය නිකුත් කිරීම සහ අයකර ගැනීමේ ප්‍රගතිය

## 2.5 කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල

### 2.5.1 කුලී ආදායම

ලෝහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ලේ වර්ග අඩි 5,500 ක් අරමුදලේ කාර්යාලය සඳහා භාවිතා කරමින් අතිරික්ත ඉඩකඩ ප්‍රමාණය පහත සහන් ආයතන වලට කුලී පදනම මත ලබා දි 2017 වර්ෂය තුල කුලී ආදායම වශයෙන් රුපියල් මිලියන 17.5 උපයා ගන්නා ලදී.

**වගුව 07 – 2017 වසරේ ගොඩනැගිලි කුලී ආදායම**

| අනු අංක | ආයතනය | කුලියට සිටින මහල | වර්ග අඩි ප්‍රමාණය | ආදායම (රු.) |
|---|---|---|---|---|
| 01 | ලෝහෝර් ආර්යා ණය අරමුදල | 3 වන මහල | 5,500 | - |
| 02 | රට ගාල | පතුල් මහල | 5,290 | - |
| 03 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | බිම් මහල | 5,500 | 6,300,000 |
| 04 | සමුපකාර සේවක කොමිෂන් සභාව | 1 - මහල | 2,415 | 2,462,790 |
| 05 | ලංකා විදුලිබල මණ්ඩලය | 1 ,2 - මහල | 4,700 | 4,500,000 |
| 06 | ලංකා විදුලිබල මණ්ඩලය තොරතුරු අංශය | 2 - මහල | 2,750 | 2,805,000 |
| 07 | රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම | 2 - මහල | 840 | 960,000 |
| 08 | ඒ.ජේ.එස්. ඇසෝසියේටඩ් ආයතනය | අංක :100/20 | 380 | 480,000 |
| | | | **27,375** | **17,507,790** |

### 2.5.2 අරමුදලේ තිරසාරභාවය

අරමුදලේ මෙහෙයුම් සහ මුල්‍ය තිරසාරභාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලයේ දැඩි අවධානය යොමුව ඇත. මෙම ආයතනය භාණ්ඩාගාරය මත හෝ අයවැය ලේඛන ප්‍රතිපාදන මත යැපෙන ආයතනයක් නොවන අතර සේවක වැටුප් ඇතුළුව සියලුම වියදම් අරමුදලේ පොලී ආදායම සහ ගොඩනැගිලි කුලී ආදායම තුලින් උපයාගනු ලැබේ. පොලී ආදායම තුල මෙහෙයුම් චිරස්ථායී බව සහතික කරනු ලබන අතර බොල් ණය, පරිපාලන වියදම් සහ ණය ආපසු අයකර ගැනිම සඳහා දැරීමට සිදුවන සියලුම වියදම් මෙම ආදායම තුල ආවරණය කරගැනීමෙන් අනතුරුව ඉතිරිවන අතිරික්තය අරමුදලේ සුරක්ෂිතතාවය තහවුරු කර ගැනීම උදෙසා මහජන බැංකුවේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත.

**වගුව 08 - ආයෝජන**

| ආයෝජන වර්ගය | බැංකුව | 2017/12/31 (රු.) | 2016/12/31 (රු.) |
|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | මහජන බැංකුව | 71,560,042 | 76,201,532 |
| ස්ථාවර තැන්පතු | ජාතික ඉතිරි කිරීමෙ බැංකුව | 16,828,012 | 15,513,431 |
| එකතුව | | **88,388,054** | **91,714,963** |

### 2.5.3 මෙහෙයුම් ආදායම

2017 වසර තුලදී මුළු මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 97 ක් වු අතර ශුද්ධ මෙහෙයුම් අතිරික්තය රුපියල් මිලියන 41.6 කි. 2016 වසර තුලදී මෙහෙයුම් ආදායම හා ශුද්ධ මෙහෙයුම් අතිරික්තය පිළිවෙලින් රුපියල් මිලියන 79 ක් හා රුපියල් මිලියන 22 ක් විය.ඒ අනුව 2016 වසරේ ශුද්ධ මෙහෙයුම් අතිරික්තය වූ රුපියල් මිලියන 22 ට සාපේක්ෂව 2017 වසරේ ශුද්ධ මෙහෙයුම් අතිරික්තයේ රුපියල් මිලියන 19.6 කට ආසන්න වර්ධනයක් අත්පත් කරගෙන ඇත. 2017.12.31 දිනට අක්‍රීය ණය ප්‍රතිපාදන වෙන් කිරීමේ ගිණුමේ පැවති අධි වෙන්කිරීම 2017 වර්ෂයේ ආදායමට එකතු වීමත්, ස්ථාවර තැන්පතු මත පොළී ආදායම සාපේක්ෂව ඉහල යාමත් හේතුවෙන් 2017 වසර තුල එම ස්ථාවර තැන්පතු පොළි ආදායම් වර්ධනය වීම මුදල් අමාත්‍යාංශය වෙතින් 2015 වසරේ ලැබුණු මෝටර් රථ 2 ක් සඳහා ගෙවීම් සහ පවරා දීමෙන් අනතුරුව මුදල් අමාත්‍යාංශය - පරිත්‍යාග ලෙස අවසන් ගිණුම් වල පෙන්නුම් කරනු ලබන මුදල 2016 - 2020 වසර දක්වා ලාභයට එකතු කල යුතු බැවින් එම වටිනාකමින් 2017 ට අයත් කොටස වර්ෂයේ ආදායමට එකතු විමත්, ගොඩනැගිලි කුලී ආදායම ඉහල යාමත් හේතුවෙන් මෙහෙයුම් ආදායම 2016 ට සාපේක්ෂව 2017 වසරේ දී 22% කින් වර්ධනය වුවද ඊට සාපේක්ෂව 2017 වසරේ දී මෙහෙයුම් වියදම 3% ක් වැනි අඩු වේගයකින් වර්ධනය වීම හා අනෙකුත් ආදායම මත බදු ප්‍රතිපාදන වල විචලනයන් යන වියදම් පහල යාමෙන් 2017 ආදායම් ඉහල යාමට සමාන්තරව ශුද්ධ මෙහෙයුම් අතිරික්තය 85% කින් වර්ධනය වී ඇත.




**ප්‍රස්තාර 04 - මෙහෙයුම් ආදායම සහ මෙහෙයුම් අතිරික්තය 2014 - 2017**

# 03

## සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය

### 3.1 සේවක අභිප්‍රේරණය ඉහළ නැංවීම

ලෝහෝර් ආර්යා ණය අරමුදලේ අරමුණු, පරමාර්ථ, ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අරමුදලේ සේවක අභිප්‍රේරණය ඉහළ නැංවීම තුලින් ශක්තිමත් ශ්‍රම බලකායක් ගොඩනැංවීම හා කාර්යක්ෂමතාවය, ඵලදායීතාව, තෘප්තිය, සාමූහික හැඟීම වර්ධනය කිරීමත් ඒ තුලින් වඩා සඵලදායී සේවාවක් සැපයීමේ අරමුණින් නිළධාරීන්ගේ විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි 2017 වර්ෂය මුළුල්ලේ විවිධ කාර්ය මණ්ඩල පුහුණු හා සංවර්ධන වැඩසටහන් වලට සේවක මණ්ඩලය යොදවන ලදී. ඒ සඳහා අරමුදලින් ඉහළ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරන ලදී.

| දිනය | මෙහෙය වන ආයතනය | පුහුණු වැඩ මුළුව | සහභාගීවූ සේවකයන් |
|---|---|---|---|
| 2017.03.27 සහ 2017.03.28 | නි. ස. අ. ( නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | ආයතන සංග්‍රහයේ විධි විධාන හා පටිපාටික රීති භාවිතය | ප්‍රධාන කළමනාකරණ සහාකාර 1<br>කළමනාකරණ සහකාර - 111 |
| 2017.04.27 සහ 2017.04.28 | නි. ස. අ. (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | ගිණුම් පොත්පත් ක්‍රමානුකූලව නඩත්තු කිරිම. | ( කලමනාකරණ සහාකාර 111) - 02 |
| 2017.05.22 සහ 2017.05.23 | නි. ස. අ. (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | විනය කාර්යය පටිපාටිය | පරිපාලන නිළධාරිනී<br>(කණිෂ්ඨ කළමනාකරණ 01) |
| 2017.05.25 සහ 2017.05.26 | නි. ස. අ. (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | කාර්යාල කාර්ය සහායකගේ රාජකාරීන් සහ වගකීම් | ( කාර්යාල කාර්ය සහයක) - 01 |
| 2017.07.04 සහ 2017.07.05 | නි. ස. අ. (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | ඊ - රාජ්‍ය සංකල්පය සහ කාර්යාල කළමනාකරණය තොරතුරු තාක්ෂණය භාවිතය | (කණිෂ්ඨ කළමනාකරණ - 111) - 01<br>( කළමනාකරණ සහකාර 1 ) - 02 |
| 2017.07.19 සහ 2017.07.20 | නි. ස. අ. (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | පුද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙන යාම | (කළමනාකරණ සහාකාර 111) - 01 |
| 2017.07.27 සහ 2017.07.28 | නි. ස. අ. (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | කාර්යාල කළමනාකරණය සහ කාර්යාල ක්‍රමවේද | ( කලමනාකරණ සහාකාර 111) - 03 |
| 2017.07.29 සහ 2017.07.30 | නි. ස. අ. (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සහ වත්කම් අපහරණය | ( කලමනාකරණ සහාකාර 111) - 01 |
| 2017.08.28 සහ 2017.08.29 | නි. ස. අ. (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | ඵලදායී රාජ්‍ය සේවයක් සඳහා ගිණුම්කරණය පිළිබඳව | (කළමනාකරණ සහකාර 1) - 02 |
| 2017.09.07 | PRAG INSTITUTE | විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම, නිවරදි කිරීමේ ක්‍රියාවලිය සහ කාර්ය සාධන විගණනය | අභ්‍යන්තර විගණක 01 |
| 2017.09.23 සහ 2017.09.24 | නි. ස. අ. (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය<br>රත්නසිරි වික්‍රමනායක පුහුණු මධ්‍යස්ථානය- හන්තාන | “වෙනස්වීම් කළ හැකිය”<br>ආකල්ප වර්ධනය සහ අභිප්‍රේරණය | අරමුදල් කාර්ය මණ්ඩලය 36 ක් සහභාගී විය.<br>(ම.කළ - 1, කණි.කළ -3,කළ.සහ.- 24, රියදුරු-1, කා.ස.-06, ගො.න. -01) |
| 2017.09.28 සහ 2017.09.29 | නි. ස. අ. (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | “අලාභ වාර්තා කිරීම, හානි පූරණය, හා කපා හැරීම පිළිබඳ ( හානි පාඩු ලේඛනය)” | ගණකාධිකාරී - (ම. කළමනාකරණ 01) |
| 2017.10.18 | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය - CETRAC | “රියදුරන් සඳහා විද්‍යාත්මක පිරිමැසුදායක සහ ආරක්ෂිත රිය පැදවීම”. | (කාර්යාල සහයක 111 / රියදුරු ) - 01 |
| 2017.10.23 සහ 2017.10.24 | නි. ස. අ. (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | “සංවර්ධන සහකාර නිළධාරීන් සහ කළමනාකරණ සහකාර වෘත්තීය සංවර්ධනය” | (කළමනාකරණ සහාකාර 11) - 02 |
| 2017.10.26 | නි. ස. අ. (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | HOW TO BE A BRILLIANT MANAGER | පරිපාලන නිළධාරිනි<br>කළමනාකරණ සහකාර 111) } 01 |
| **2017.12.14 සහ 2017.12.15** | **නි. ස. අ. (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය** | **කාර්යාල උපකරණ පාලනය** | **( කලමනාකරණ සහාකාර 111) - 01** |

විෂයානුබද්ධ පුහුණු වැඩමුළු සඳහා අරමුදලේ සේවක මණ්ඩලය සහභාගී කරවීම තුලින් ආයතනයේ රාජකාරි කටයුතු කාර්යයන් පෙරට වඩා කාර්යක්ෂමව සහ ඵලදායීව කරගෙන යාමත්, වෘත්තීය කටයුතු තුල පෙර පැවති තත්වයට වඩා පැහැදිලි ප්‍රගමනයක් දක්නට ලැබීමත් සුවිශේෂීත්වයකි. එම පුහුණු වැඩමුළුවෙහි දී ලබා ගත් දැනුම, කුසලතා තම රාජකාරි කටයුතු වලදී විනිවිදභාවයකින් යුක්තව උපයෝජනය කිරීම තුලින් තම රාජකාරීන් විධිමත්ව සහ ක්‍රමානුකූලව කරගෙන යාමට සේවක මණ්ඩලයට හැකියාව ලැබී ඇත. ඒ තුලින් වෘත්තීය ජීවිතයේ කාර්යක්ෂමතාවය සහ අභිමතාර්ථයින් සාක්ෂාත් කර ගැනීමත්, පුද්ගල සංවර්ධනය ඇති කිරීමට මෙන්ම ලෝහෝර් ආර්යා ණය අරමුදලේ අරමුණු කරා ගමන් කිරීමේ හැරවුම් ලක්ෂ්‍ය බවට පත්වීමට ඉහත පුහුණු සහ සංවර්ධන වැඩමුළු බෙහෙවින් උපයෝගී වී ඇත.

**මීට අමතරව සේවක අභිප්‍රේරණය ඉහළ නැංවීම වෙනුවෙන් නිපුණතා සංවර්ධන අරමුදල හා එක්ව 2017.09.23 සහ 24 යන දිනයන්හි බැහැරගත පුහුණු ක්‍රියාකාරකම් වැඩමුළුවක් හන්තාන, රත්නසිරි වික්‍රමනායක පුහුණු මධ්‍යස්ථානයෙහි පවත්වන ලදී. ඊට අරමුදලේ සේවක මණ්ඩලයේ 36 දෙනෙකු සහභාගී වන ලදී.**

මෙම බැහැරගත පුහුණු වැඩමුළුව මගින් පවත්වන ලද සමස්ත පුහුණු වැඩසටහන් තුලම ගැබ් වී තිබුනේ කණ්ඩායමක් වශයෙන් ඉතාම අවම ආයාසයක් දරා උපායශීලිව කණ්ඩායම් අරමුණු ලඟා කර ගැනීම පිලිබඳ ක්‍රමවත් පුහුණුවක් ලබා දීමයි. එම පුහුණුව අප ආයතනයේ අරමුණු ඉටු කිරීමට අදාලව ආදේශ කර ගැනීමෙන් මෙහිදී කණ්ඩායම් හැඟීමෙන් ක්‍රියා කරමින් අවම ආයාසයක් දරා එකිනෙකා අතර, අන්‍යෝන්‍ය සහයෝගීතාවයකින් යුක්තව ආයතනික මෙහෙවර ඉටුකර ගැනීමට මහඟු ලෙස ඉවහල් වූ බව මෙහිලා සඳහන් කල හැක.

එසේම ඒකාකාරි කාර්යාලීය රැකියා ජීවිතයෙන් මිදී විනෝදය සහිත පුහුණු වැඩසටහන් ක්‍රියාවලියක කාර්ය මණ්ඩලය නිරත කරවීම මගින් ඔවුන්ගේ පැවැති වෘත්තිය පීඩනයන් සඳහා යම් සහනයක්/ වෙනසක් ලබා දීමට හැකි වීමද සියළුම තල වල කාර්ය මණ්ඩල සාමාජිකයන් එකම කණ්ඩායමක අරමුණු ඔස්සේ ක්‍රියා කිරීම මගින් අන්තර් පුද්ගල සම්බන්ධතා වර්ධනය වීමක්ද මෙමගින් ලබා ගැනීමට හැකි වී ඇත.





- එම බැහැරගත පුහුණු වැඩමුළුවේ විශේෂ අවස්ථාවන් සහිත ඡායාරූප පහතින් දැක්වේ.













- **හන්තාන - බැහැරගත පුහුණු ක්‍රියාකාරකම් වැඩමුළුවේ කාර්ය මණ්ඩලය සහභාගී වූ කණ්ඩායම් තරඟ අවස්ථාවන්**

## 3.2 අරමුදලේ බඳවා ගැනීමේ සහ උසස්වීම් පරිපාටීන්

### නව බඳවා ගැනීම

**3.2.1** 2015 වසරේදී මුදල් අමාත්‍යාංශයේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද තොරතුරු තාක්ෂණ නිලධාරි තනතුර සඳහා 2017.11.01 වන දින නව නිලධාරියෙකු බඳවා ගන්නා ලදී.

**3.2.2** අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය තුල පුරප්පාඩු වූ කළමනාකරණ සහකාර සහ කාර්යාල සහායක තනතුරු සඳහා අයදුම්පත් කැඳවා අරමුදලේ නිල වෙබ් අඩවිය මගින් සහ පුවත්පත් දැන්වීම් හරහා ප්‍රචාරණය කිරීමෙන් පසු ආකර්ෂණය කරගත් අයදුම්පත් අතුරින් විනිවිදභාවයකින් යුක්තව සුදුසු අයදුම්කරුවන් තෝරා විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මෙහෙයවීම මගින් කළමනාකරණ සහකාර 111 තනතුර සඳහා නව නිලධාරින් 04 දෙනෙකු ද, කාර්යාල කාර්ය සහායක 111 යන ශ්‍රේණියේ තනතුර සඳහා 2017.12.04 වන දින නව කනිෂ්ඨ නිලධාරියෙකු ද අරමුදලට බඳවා ගන්නා ලදී. ඒ අනුව 2017 වසර තුළ නව බඳවා ගැනීම් 06 ක් සිදුකර ඇත.

## 3.3 අරමුදල් පරිශ්‍රය නවීකරණය කිරීම

වසර ගණනාවක කාලයක් තුල පූර්ණ අළුත්වැඩියාවකට භාජනය නොවූ ලෝහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ල වර්තමානයට සුදුසු අයුරින් නවීකරණය කිරීමේ කටයුතු 2015 නොවැම්බර් මසදී ආරම්භ කරන ලදී. එම අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් අවම මිළ ගණන් ඉදිරිපත් කල සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව 2015.09.25 දින පැවැත්වූ 828 භාරකාර මණ්ඩල රැස්වීමේදී තෝරා ගන්නා ලද අතර, මෙම අළුත්වැඩියා කිරීමේ කාර්තව්‍ය සඳහා වූ පිරිවිතර සකස් කිරීම සහ ගෙවීම් කටයුතු සිදු කිරීමේදී ප්‍රමාණාත්මක ක්‍රමවේදයන් අනුව ගෙවීම් බිල්පත් තක්සේරු වටිනාකම් මිනීම හා සුපරික්ෂණය ඇතුළු උපදේශන සේවාවන් ලබා ගැනීමට රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව පත්කර ගැනීමට තීරණය කරන ලදී.

ඒ අනුව 2017 වසර අවසාන වන විට මුළු ඇස්තමේන්තුගත මුදල රුපියල් 23,462,043.69 වන ව්‍යාපෘති වටිනාකමින් රු. 4,532,134.11 ගෙවා අරමුදල් ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු බොහෝමයක් නිමකර ඇත.

## 3.4 කාර්යාලීය ක්‍රමවේදයන් විධිමත් කිරීම

